# වාර්තාව

**1983-2009 කාලය තුළ ශ්‍රී ලංකාවේ සන්නද්ධ ගැටුම්, දේශපාලන නොසන්සුන්තාවන් හෝ සිවිල් කැළඹීම්වල ප්‍රතිඵලයක් ලෙස මියගිය පුද්ගලයන් අනුස්මරණය කිරීම සඳහා ස්මාරකයක් ඉදිකිරීම සම්බන්ධයෙන් පත් කරන ලද විශේෂඥ කමිටුව**

**මැයි 31, 2024**

## **කමිටුවේ සංයුතිය**

| | | |
|---|---|---|
| 1. | **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජගත් වීරසිංහ** | සභාපති |
| 2. | **මහාචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර**<br>ඉතිහාසය හා කලා සිද්ධාන්ත පිළිබඳ මහාචාර්ය<br>සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය | සාමාජික |
| 3. | **මහාචාර්ය ෆර්සානා එෆ්. හනීෆා**<br>සමාජ විද්‍යාව පිළිබඳ මහාචාර්ය, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය | සාමාජික |
| 4. | **මහාචාර්ය ටී. සනාතනන්**<br>අංශ ප්‍රධානි, ලලිත කලා අංශය, යාපනය විශ්ව විද්‍යාලය | සාමාජික |
| 5. | **එස් ඒ ටී එස් සූරියආරච්චි**<br>වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික සමගිය සහ ප්‍රතිසන්ධාන කාර්යාලය | සාමාජික |
| 6. | **මහින්ද විතානාරච්චි**<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය | සාමාජික |

**1983-2009 කාලය තුළ ශ්‍රී ලංකාවේ සන්නද්ධ ගැටුම්, දේශපාලන නොසන්සුන්තාවන් හෝ සිවිල් කැළඹීම්වල ප්‍රතිඵලයක් ලෙස මියගිය පුද්ගලයන් අනුස්මරණය කිරීම සඳහා ස්මාරකයක් ඉදිකිරීම සම්බන්ධයෙන් පත් කරන ලද විශේෂඥ කමිටුවේ වාර්තාව**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජගත් වීරසිංහ (සභාපති), මහාචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර, මහාචාර්ය ටී. සනාතනන්, මහාචාර්ය ෆර්සානා එෆ්. හනීෆා, ජාතික සමගිය සහ ප්‍රතිසන්ධාන කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් දීප්ති ළමාහේවා (ඔහුගේ සේවා කාලයෙන් පසු ජාතික සමගිය සහ ප්‍රතිසන්ධාන කාර්යාලයේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් වූ එස් ඒ ටී එස් සූරියආරච්චි) සහ නාගරික සංවර්ධන අධිකාරියේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් මහින්ද විතානාරච්චි යන අයගෙන් සමන්විත විශේෂඥ කමිටුවක් 2023 අගෝස්තු මාසයේදී පත් කරනු ලැබීය. එම කමිටුව වෙත පහත සඳහන් කාර්යය පැවරී තිබුණි:

1. 1983-2009 කාලය තුළ ශ්‍රී ලංකාවේ සන්නද්ධ ගැටුම්, දේශපාලන නොසන්සුන්තාවයන් හෝ සිවිල් කැළඹීම්වල ප්‍රතිඵලයක් ලෙස මියගිය සිවිල් වැසියන්, ත්‍රිවිධ හමුදා සහ පොලීසියේ සාමාජිකයන් සහ හිටපු සටන්කාමීන් ඇතුළු සියලුම පුද්ගලයන් අනුස්මරණය කිරීම සඳහා ස්මාරකයක් සංහිඳියාවේ සහ ප්‍රතිසන්ධානයේ සංකේතයක් ලෙස කොළඹ නගරයේ සුදුසු ස්ථානයක ඉදිකිරීමේ කටයුතු සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.

2. පීඩාවට පත් පුද්ගලයින්ගේ හිමිකාරිත්වය සහ සහයෝගය ලැබෙන ලෙසත්, ගැටුම් නැවත ඇති නොවීමට සාමූහික කැප වීම පෝෂණය වන ලෙසත්, සියලු ශ්‍රී ලාංකිකයන් අතර ජනවාර්ගික සංහිඳියාව සහ ප්‍රතිසන්ධානය සාක්ෂාත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා වන ආකාරයටත් ඉහත කී ස්මාරකය සැලසුම් කිරීම හා නිර්මාණය කිරීම.

ජාතික ස්මාරකයක් ඉදි කිරීම සඳහා වන යෝජනාවක් තුළින් රට ප්‍රතිසන්ධානය කරා ගෙන යාමට ජනාධිපතිතුමා පළ කරනු ලබන අභිලාෂය අපි අගය කරන්නෙමු. ශ්‍රී ලංකාවේ සන්නද්ධ ගැටුම්වල ප්‍රතිඵලයක් ලෙස මියගිය සිවිල් වැසියන්, ත්‍රිවිධ හමුදා සහ පොලීසියේ සාමාජිකයන් සහ හිටපු සටන්කාමීන් ඇතුළු සියලුම පුද්ගලයන් අනුස්මරණය කිරීම සඳහා වූ ස්මාරකයක් සංහිඳියාවේ සහ ප්‍රතිසන්ධානයේ සංකේතයක් ලෙස ඉදිකිරීම යුද්ධය අවසන් වී දශක එකහමාරක් ගතවී ඇති මෙම අවස්ථාවේ හි ඉටු කළ යුතු වැදගත් කටයුත්තක් බව කමිටුව විසින් පිළිගනු ලැබේ. මෙම ව්‍යාපෘතිය, දුෂ්කර අතීතයකින් ප්‍රකෘතිමත් වීම වෙනුවෙන් රාජ්‍ය විසින් දරනු ලබන වෑයම පිළිබිඹු කරන්නක් මෙන්ම විවිධත්වය සහ සහජීවනය වටිනාකම් ලෙස සලකනු ලබන අනාගතයක් ගොඩනැගීමේ රාජ්‍ය අභිලාෂයේ නිරූපණයක් ලෙස කමිටුව විසින් හඳුනා ගන්නා ලදී.

මෙම කර්තව්‍යය සඳහා වන අප විසින් උපයෝගී කරගත් ක්‍රමවේදය ගොඩනගාගැනීම සඳහා ජනාධිපති කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද සටහනෙහි අන්තර්ගත, ‘‘පීඩාවට පත් පුද්ගලයින්ගේ හිමිකාරිත්වය සහ සහයෝගය ලබා ගැනීම’’ යන වචන වඩාත් වැදගත්කොට සලකනු ලැබීය. අප විසින් උතුරු සහ දකුණු පළාත්වල මෙන්ම කුරුණෑගල දිස්ත්‍රික්කයේ පීඩාවට පත් ජනතාව සහ සිවිල් සමාජ සාමාජිකයන්ගේ අදහස් විමසූ අතර ප්‍රතිසන්ධානය සහ අනුස්මරණය යන ක්ෂේත්‍රයන්හි නිරත විශේෂඥයන් ද හමුවුණි. අපගේ අදහස් විමසුම සියලුම ජනවාර්ගික කණ්ඩායම් නියෝජනය කරමින් සිදුකළ නමුත් ප්‍රස්තුත විෂය සම්බන්ධව පවතින අදහස් මුළුමනින්ම පාහේ ආවරණය කිරීමට බොහෝවිට හැකියාවක් නොපවතින බව ප්‍රකාශ කළ යුතු ය. පහත දැක්වෙන වාර්තාව, අපගේ සොයා ගැනීම් සහ නිර්දේශ ඇතුළත් සාරාංශයකි.

**යුද්ධයේ කම්පනය ගැටුම් පැවති ප්‍රදේශයන්හි සහ සොල්දාදුවන්ගේ පවුල් අතර අඛණ්ඩව තවමත් පවතින බව අදහස් විමසුමෙන් පැහැදිලි විය.** යුද්ධයේ කැළැල් ඔවුන් තුළ ස්ථාවරව පවතින බව පෙනෙන්නට තිබුණි. උතුරු සහ නැගෙනහිර පළාත්වල වෙසෙන බොහෝ ප්‍රජාව අතර රාජ්‍ය කෙරෙහි අවිශ්වාසයක් මෙන්ම බියක්, විශේෂයෙන් අනුස්මරණ තහනම් කිරීම සමඟ ඇති වී ඇත. දකුණේ සිංහල ප්‍රජාව සහ උතුරු, නැගෙනහිර පළාතේ දෙමළ ප්‍රජාව අතර විශාල සහ පැහැදිලිව

දිස්වන බල විෂමතාවක් ඇති බව පැහැදිලි වූ අතර, යුධ කාලයේදී උතුරේ ජනයා පීඩාවට පත් වූයේ කෙසේද යන්න පිළිබඳ සංවේදී අවබෝධයක් දකුණේ ජනතාවට ප්‍රමාණවත් පරිදි නොමැති බව උතුරේ ජනතාවගේ හැඟීම බවත් පෙනුණි. උතුර සහ නැගෙනහිර ජනතාව තවමත් යුධ සමයේ දී පැතිරුණු විරුද්ධවාදි අදහස් ඇතිව දකුණේ ජනයා පිළිබඳ අදහස් දක්වනු ලැබීය.

**ත්‍රිකුණාමලය සහ කුරුණෑගල ප්‍රදේශයේ හිටපු හමුදා සාමාජිකයන් විසින් රණවිරුවන් සමඟ එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් අනුස්මරණය කිරීම ප්‍රතික්ෂේප කළ අතර එමගින් එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් රණවිරුවන් හා සමාන මට්ටමක තැබීමක් හා එල්.ටී.ටී.ඊ. ක්‍රියාකාරකම් සඳහා නීත්‍යානුකූල බවක් ආරෝපණය වීමක් විය හැකි බව ඔවුන්ගේ හැඟීම විය.** උතුරේ සිවිල් කණ්ඩායම් විසින් ඔවුන්ගේ මියගිය ආදරණීයන්ට එරෙහි අපරාධකරුවන් සේ සලකන හමුදා සාමාජිකයන් සමඟ සිය මියගිය පිරිස් අනුස්මරණය කිරීම ප්‍රතික්ෂේප කරන ලදී. අප විසින් අදහස් විමසන ලද විශේෂඥයන්ගේ ද නිර්දේශය වූයේ, කිසිදු ස්මාරයකයක් ඉදි කිරීම සඳහා හමුදා ශ්‍රමය යොදා නොගන්නා බවට අප සහතික විය යුතු බවයි.

**අප විසින් එක් එක් ප්‍රජාවන් අතර වෙනස්කම් මෙන් ම සංචාරය කළ එක් එක් දිස්ත්‍රික්කයන්ට ආවේණික විශේෂතා නිරීක්ෂණය කරන ලදී.** අනුස්මරණය කිරීමේ මුලපිරීමක් වශයෙන් ඉතිහාසය ලේඛනගත කිරීම සඳහා ඉල්ලීමක් 1990 දී නෙරපා හරින ලද මුස්ලිම් ප්‍රජාව අතරින් මතු විය. මුල්ලිවයිකාල් හි ස්මාරකයක් ඉදිකිරීම පිළිබඳ සාකච්ඡා කිරීමේ දී, ස්මාරක ස්ථාපනය කරන ස්ථානයන් වැදගත් බව සඳහන් වූ අතර, ඇතැම් ස්ථාන මියගිය එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් අනුස්මරණය සඳහා පමණක් සීමා විය හැකි බවත්, මියගිය අනෙකුත් පිරිස සඳහා එවැනි ස්ථානවල දී ලැබෙන අවධානය අවම විය හැකි බවත්, ඒ සඳහා හේතු ලෙස ප්‍රකාශ විය. යුධ සමයේ දී හටගත් ජාතීන් අතර ආතතීන් නැගෙනහිර පළාත තුළ නිරීක්ෂණය වූ අතර ත්‍රිකුණාමලය සහ මඩකලපු දිස්ත්‍රික්කයේ පැවති රැස්වීම්වල සාකච්ඡාවන් හී දී මෙම සාධකය මතු වනු දක්නට ලැබුණි.

**රාජ්‍ය විසින් විවිධ මට්ටමින් තමා නොසලකා හැර ඇති බවට සංවේදනයක් සෑම ප්‍රජාවකටම අයත් ජනතාව අතරින් විද්‍යමාන විය.** පශ්චාත් යුධ පීඩාවන්ගෙන් අත් මිදීමට තමන්ට ඉඩ ලැබී නොමැති බවට උතුරු සහ නැගෙනහිර දෙමළ ප්‍රජාවගේ සංවේදනය වූ අතර අනුස්මරණ සඳහා අවසර නොලැබීම, අතුරුදහන්වූවන් සම්බන්ධයෙන් තවමත් පවතින නොවිසඳුනු ගැටලු සහ හමුදාවේ සහ පොලිසියේ දැඩි සෝදිසි කිරීම් සහ හිරිහැරවලට නිරන්තරයෙන් ලක්වීම ඔවුන්ගේ දුක් ගැනවිලි අතර විය. මීට අමතරව, ඉඩම් බලහත්කාරයෙන් අල්ලා ගැනීම, බෞද්ධාගමිකයින් ජීවත් නොවන ස්ථානයන්හි බෞද්ධ ස්තූප සහ බුද්ධ ප්‍රතිමා ඉදි කිරීම සහ හමුදාව විසින් ඉදි කරන ලද කැපී පෙනෙන විජයග්‍රහණ ස්මාරක උතුරු සහ නැගෙනහිර පළාත තුළ හමුදාකරණයේ සහ සිංහල ජනපදකරණයේ හැඟවුම් වශයෙන් ඔවුන් විසින් දක්නා බව පැහැදිලි විය. දකුණේ සිංහල ජනයාගේ සංවේදාතාවන් මත පමණක් පදනම්ව මධ්‍යම රජය යම් අවස්ථාවන්හී දී ක්‍රියාත්මක වීම තුළ, රාජ්‍ය උතුරේ සහ නැගෙනහිර ජනතාව නොවැදගත් කොට සලකන බවට අදහසක් ඔවුන් තුළ ගොඩනැගී ඇති බව පෙනේ. එවැනි ක්‍රියාත්මකවීම් සංහිඳියාව සහ ප්‍රතිසන්ධානය කෙරෙහි රාජ්‍ය විසින් ප්‍රදර්ශනය කරනු ලබන උනන්දුවට පරස්පර බවද ඔවුන් ප්‍රකාශ කරයි. ප්‍රතිසන්ධාන ක්‍රියාවලි ආරම්භ කිරීමට රාජ්‍ය විසින් මීට පෙර දරන ලද බොහෝ උත්සාහයන් පිළිබඳව - ප්‍රතිසන්ධාන යාන්ත්‍රණය පිළිබඳ උපදේශන කාර්ය සාධන බලකාය සහ අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලය සම්බන්ධයෙන් අදහස් මතු වූ අතර ඒවා හි විශ්වාසනීයත්වය පිළිබඳ සැකය පැහැදිලිව ප්‍රකාශ විය. එම ක්‍රියාවලීන්ගේ සංකල්පමය වටිනාකම අගය කෙරුණත් ඒවා අසංවිධිතව සහ ප්‍රමාණවත් රාජ්‍ය සහයෝගයකින් තොරව ඉදිරිපත් කර ඇති බව ඔවුන්ගේ හැඟීම විය. එම නිසා මෙම උත්සාහයන් සැබෑ ලෙසම පීඩාවට පත් වූවන් ඉලක්ක නොවූ පිටස්තර පාර්ශවයන්ගේ නිරීක්ෂණය උදෙසා ක්‍රියාත්මක වන වැඩපිළිවෙළ බවට මත ඉදිරිපත් විය. මෙම අදහස් මත පිහිටා ප්‍රතිසන්ධානය අරමුණු කර ගනිමින් අනුස්මරණ ස්මාරකයක් ඉදිකිරීම සම්බන්ධයෙන් රාජ්‍ය දරන උත්සහයේ අවංකත්වය ප්‍රශ්න කෙරුණි. සාධාරණය සහ වගවීම

නොමැති ප්‍රතිසන්ධානය යනු හුදෙක් ආධිපත්‍යය පවත්වාගෙන යෑමක් බව ද අප වෙත ප්‍රකාශ කරන ලදී.

**වසර ගණනාවක් පුරා ප්‍රශංසා සිදුකර, අනතුරුව මෑතක සිට රාජ්‍ය තමන්ව අත්හැර දමා ඇතැයි සිංහල හමුදා සාමාජිකයන්ගේ පවුල්වලට හැඟී ගොස් තිබිණි. සිය දරුවන් අහිමි වීම නිසා ඇති වූ අමනාපයක් දෙමාපියන්ගෙන් ප්‍රකාශ වූ අතර හිටපු හමුදා සොල්දාදුවන් තම තරුණ කාලය, පවුල් ජීවිතය සහ සෞඛ්‍ය මෙම ගැටුම් නිසා අහිමි වීම පිළිබඳ පසුතැවිලි විය.** සෑම ජන හමුවක දීම ජනතාව එක ලෙස ප්‍රකාශ කළ මතය වූයේ රාජ්‍ය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඕනෑම ප්‍රතිසන්ධාන වැඩපිළිවෙළක් දේශපාලන වාසි තකා වූ දේශපාලනඥයන්ගේ මැදිහත්වීම්වලින් වෙන් කර සිදු කළ යුතු බවයි.

රාජ්‍ය මැදිහත් වූ අනුස්මරණය සම්බන්ධයෙන් පීඩාවට පත් ජනතාවගේ අදහස් පිළිබඳ අපගේ ප්‍රධාන සොයා ගැනීම් පහත පරිදි සම්පිණ්ඩනය කළ හැකිය:

**හමුදාව සහ පොලිසිය විසින් අනුස්මරණ සිදු කිරීමෙන් ජනතාව වළක්වන, අනුස්මරණ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීම අධිකරණය ක්රියාමාර්ගවල මුහුණ දීමට හේතුවන සන්දර්භයක් තුළ ජාතික අනුස්මරණ/ ස්මාරක පිළිබඳ සාකච්ඡා කිරීම ජනතාව තුළ යම් කම්පනයක් ඇති කරන බවත්, එය රාජ්‍ය විසින් කරන නොමග යැවීමක් හෝ රැවටීමක් ලෙස සැකයට බඳුන් වන බවත් නිරීක්ෂණය විය.** ජාතික ස්මාරකයක් පිළිබඳ අදහස සම්බන්ධයෙන් උතුරු නැගෙනහිර ජනතාව කලකිරීම, කෝපය සහ අවිශ්වාසය පළ කළහ. මිය ගිය අය අනුස්මරණයට සහ සිහි කිරීමට උත්සාහ දැරීමේදී පොලිසිය සහ හමුදාව හි සෘණාත්මක ප්‍රතිචාර අත් විඳීමට ඔවුන්ට සිදු වේ. යුද්ධය අවසන් වූ විගස ම බොහෝ පවුල් තම අහිමි වූ ආදරණීයයන් සඳහා වැදගත් ස්මාරක ලෙස සලකන ලද එල්.ටී.ටී.ඊ. සංවිධානයේ දිවිපිදුවන්ගේ සුසාන භූමි හමුදාව විසින් විනාශ කර තිබුණි. හමුදාව විසින් එම සුසාන භූමිවල බැරැක්ක, රථ ගාල සහ වැසිකිළි ඉදිකර තිබූ අතර එක් අවස්ථාවකදී එම සොහොන් බිම්හි වගා කර එම අස්වැන්න ජනතාවගේ පරිභෝජනය සඳහා මුදාහැරීමට උත්සාහ ගත් බව වාර්තා වේ. එවැනි ක්‍රියා, දෙමළ ජනතාව වෙත එල්ල කරන ලද අපහාසයක් සහ රාජ්‍යයේ ද්වේෂ සහගත බව පෙන්නුම් කිරීමක් ලෙස ජනතාව සලකන බව පෙනී යයි. එබැවින් රාජ්‍යයේ යහපත් චේතනාවන් කෙරෙහි ඔවුන් තුළ වූයේ අල්ප විශ්වාසයකි. ජාතික ස්මාරකයක් ඉදි කිරීම සඳහා සිදු කරනු ලබන මුල් පිරීම ජනතාව නොමග යැවීමට රාජ්‍ය උත්සාහ කරන බව පෙන්නුම් කරන සාක්ෂියක් වශයෙන් සලකන ලදී. ඔවුන්ගේම මූලිකත්වයෙන් ඔවුන්ගේම ස්ථානවල අනුස්මරණය කිරීමට අවසරය ජනතාවගේ මූලික අභිලාෂය බව පැහැදිලි විය. අනුස්මරණ කටයුතුවල නියැලී සිටි පුද්ගලයන් මහජන සාමය කඩ කිරීම සම්බන්ධයෙන් අසංවිධිත චෝදනා යටතේ මේ වන විට නඩු කටයුතුවලට මුහුණ දෙමින් සිටින බව ප්‍රකාශ විය. උතුරේ පැවති බොහෝ රැස්වීම්වලදී, දිවිපිදුවන් සඳහා වූ විනාශයටපත් සුසාන භූමි ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් විය. දෛනික සෝදිසි කිරීම් ඇතුළු දෛනික ජීවිතයේ නිරන්තර බාධකවලට මුහුණ දෙන පුනරුත්ථාපනය වූ හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් විසින් එවැනි ස්මාරකයක් නැරඹීමට කොළඹ නගරයට ගමන් කිරීමටවත් තමන්ට හැකිවේ ද සහ දැනට ක්‍රියාත්මක ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අනුව එවැනි ගමනක් සඳහා ඔවුන්ට අවසරයක් පවතීද යන්න පිළිබඳව සැක පළකරන ලදී. උදාහරණයක් ලෙස මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාව පිළිබඳ පනත් කෙටුම්පත හරහා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සඳහා සීමා උද්ගතවන සන්දර්භයක් තුළ මෙන්ම දැනට ක්‍රියාත්මක ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අනුවත්, කොළඹ නගරයේ ඉදි කරනු ලබන ස්මාරකයක අන්තර්ගතය පිළිබඳව ව්‍යාකූලත්වයක් ප්‍රකාශ විය. රාජ්‍යන් වෙනස් වනවිට අනුස්මරණය හා සම්බන්ධ කුමන මූලධර්ම අඛණ්ඩව ක්‍රියාත්මක වේද යන්න පිළිබඳව ද සැකයන් මතු කරන ලදී. මේ සමඟ අනුස්මරණ කිරීම් නීත්‍යානුකූලව සහතික කළ යුතුය යනුවෙන් යෝජනාවක් ඉදිරිපත් විය. සමරු උත්සව සහ අනුස්මරණය සඳහා පවතින ජනතාවගේ අයිතිය ආරක්ෂා කිරීම සඳහා විශේෂ පනතක් ක්‍රියාත්මක විය යුතු බවට සමහර පුද්ගලයන් අදහස් දක්වන ලදී. (2018 අංක 34 දරන

හානිපූරණය සඳහා වන කාර්යාලය පනත මඟින් අනුස්මරණය කිරීම සඳහා ඇති අයිතිය පිළිගෙන ඇති බව කමිටුව හඳුනාගනී.)

**පීඩාවට පත් පුද්ගලයන් අතර බොහෝ දෙනා දරිද්‍රතාවයෙන් පෙළෙන පසුබිම්වලට අයත් වූ අතර මේවන විට දැඩි ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දෙමින් සිටිති. ආර්ථික අර්බුදය, එම දුෂ්කරතා වඩාත් උග්‍ර කර ඇත. එවැනි අවස්ථාවකදී, රාජ්‍ය විසින් ස්මාරකයක් ඉදි කිරීමට යෝජනා කිරීම මේ අර්බුදකාරී අවස්ථාවේ විපතටපත් වූවන්ගේ දුක්ඛිත තත්ත්වය පිළිබඳව කිසිදු සැලකිල්ලක් නොදැක්වීමක් බවට සංවේදනයක් ඇති කරන බවට පෙනෙන්නට තිබුණි.** යුද්ධයෙන් ස්වාමිපුරුෂයන් අහිමි වූ කාන්තාවන්, ස්වාමිපුරුෂයන් හෝ සහෝදරයන් අතුරුදහන් වූ කාන්තාවන්, දරුවන් අතුරුදහන් වූ පිරිමින් සහ කාන්තාවන් අපට හමු වූ අතර ඔවුන්ගෙන් බොහෝමයක් සමීපතමයන් අහිමි වීම නිසා පත් වූ කම්පනයට අමතරව දැඩි ආර්ථික දුෂ්කරතාවන්ටද පත්ව සිටිති. පීඩාවට පත්වූ පුද්ගලයන්, විශේෂයෙන්ම ගෘහ මූලික කාන්තාවන් දිළිඳුකම හේතුවෙන් ස්වයං හානි (self-harming) සිදුකර ගැනීමට පෙළඹී ඇති බව අපට අනාවරණය විය. විදුලි බිල්පත් ගෙවීමට නොහැකි වීම නිසා කාන්තාවන් සියදිවි නසා ගැනීම් පිළිබඳ සිදුවීම් ජනතාව විසින් අප වෙත පවසන ලදී. අම්පාර දිස්ත්‍රික්කයේ සමහර බොහෝ පිටිසර ගම්මානයන්හි ජනතාව හා රාජ්‍ය අතර අන්තර් සම්බන්ධය ඉතා අවම බව දක්නට ලැබුණු අතර යුධ කාලයේදී සහ ඉන් අනතුරුවත් ඔවුන් වෙත ලැබී ඇති රාජ්‍ය අනුග්‍රහය අතිශය දුර්වල බව පැහැදිලි විය. 1990 වසරවලදී ඔවුන්ට සිදු වූ අහිමිවීම් වෙනුවෙන් රජයෙන් ලැබුණු එක් වන්දි මුදලක් පිළිබඳව කතා කළ අතර එතැන් සිට කිසිදු ආකාරයක සහයෝගයක් ලැබී නොමැත. මෙම පුද්ගලයන්හට ස්මාරකයක ඇති ප්‍රයෝජනය ගැන කල්පනා කිරීම පවා දුෂ්කර බව හැඟුණි. ස්මාරකයක් වෙනුවට මියගිය ආදරණීයයන් සිහි කරමින් නිවාස, වැසිකිළි ආදී යම් ප්‍රයෝජනවත් ආකාරයේ ඉදිකිරීමක් ඔවුන් ඉල්ලා සිටින ලදී. ස්මාරකය ඵලදායී වීමට නම්, එය ප්‍රජාව වෙනුවෙන් යම් සේවයක් ඉටු කළ යුතු යැයි ඔවුන් තර්ක කරන ලදී. තොරතුරු විමසීමේදී පෙනී ගිය කරුණ වූයේ, පවුල්වල සාමාජිකයන්ගේ අහිමි වීම් සහ අතුරුදහන්වීම්වලින් පීඩාවට පත් වූ ජනතාව මුහුණ පෑ බොහෝ සමාජීය හා ආර්ථික ගැටලුවලට රාජ්‍යය විසින් කිසිදු ආකාරයකින් විසඳුම් ලබා දී නොමැති බවයි. මායිම් ප්‍රදේශවල වෙසෙන යම් පිරිස් සම්පූර්ණයෙන්ම නොසලකා හැර ඇති බව පෙනේ. රාජ්‍ය මෙම ජනතාවගේ සමාජීය හා ආර්ථික යහපැවැත්ම සඳහා තිරසාර ලෙස අරමුදල් යොමු කිරීම අවශ්‍ය වේ. දෛනිකව උග්‍ර වන ආර්ථික අර්බුදය මධ්‍යයේ ස්මාරකයක් ඉදි කිරීම ආර්ථිකමය වශයෙන් ප්‍රමුඛතාව නොවන බව ජනතාව ඉතා පැහැදිලිව ප්‍රකාශ කරන ලදී. උතුරු සහ නැගෙනහිර පළාත්වල ජීවත් වන පවුල් ආර්ථික අර්බුදයෙන් දැඩිව පීඩාවට පත් වන අතර අමතර ආතතියකටද මුහුණ පා සිටී. හමුදා පවුල් සඳහා අඛණ්ඩව වැටුප් හා විශ්‍රාම වැටුප් ලැබීම හේතුවෙන් ආර්ථිකමය වශයෙන් අඩු මට්ටමකින් පීඩාවට පත්ව ඇති නමුත්, දරුවන් අහිමිවීම පිළිබඳ දෙමාපියන් කණගාටුව සහ අමනාපය ප්‍රකාශ කළ අතර හිටපු සෙබළුන් ගැටුම් හේතුවෙන් අහිමි වූ සිය තරුණ කාලය හා සෞඛ්‍ය පිළිබඳ කණගාටුව පළ කරන ලදී.

**දශක තුනක කාලයක් පුරාවට පැවති යුද්ධය නිසා ඇති වූ ආතතීන් සහ විපාක සංසිඳවීම සඳහා ප්‍රමාණවත් උත්සාහයක් මේවන තුරු දරා නොමැති බව ජනතාවගේ අදහස විය. ජාතික ස්මාරකයක් හරහා වැඩිදුරටත් සුවපත් කළ හැකි පරිදි ජාතික මට්ටමින් හෝ ප්‍රජා මට්ටමින් ප්‍රමාණවත් ප්‍රතිසන්ධානයක් සිදු වී නොමැති බවට නිරීක්ෂණය වේ.** උතුරු හා නැගෙනහිර පළාත්වල දිගින් දිගටම හමුදාව රැඳී සිටීම සම්බන්ධව අප්‍රසාදයක් එම ප්‍රදේශවල ජනතාව තුළ පවතින අතර එය රාජ්‍ය විසින් තමන් දෙවන පන්තියේ පුරවැසියන් ගණයෙහිලා සැලකීමක් බවට පෙන්වා දෙනු ලැබිණි. මෙවැනි සන්දර්භයන් තුළ, සාමුහික ජාතික අනුස්මරණයක් සිදු කිරීමට සුදුසු පරිසරයක් නොපවතින බව කමිටුවේ නිරීක්ෂණයයි. 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කළ ප්‍රතිසන්ධාන යාන්ත්‍රණය පිළිබඳ උපදේශන කාර්ය සාධන බලකායේ වාර්තාව ජනාධිපතිවරයා වෙත යොමු නොවූ බව ඔවුන් විසින් පෙන්වා දෙන ලදී. ඔවුන් ප්‍රකාශ කළේ, මූලික වශයෙන් නියත ප්‍රතිඵල නොමැතිව සෑම වසර කිහිපයකට වරක් මෙවැනි ක්‍රියාවලියක බුද්ධිමතුන් නිරත කරමින් රාජ්‍ය විසින් ඔවුන්ගේ කාලය නාස්ති කළ බවයි. ආයතන පිහිටුවීම සිදු කරනු ලැබුව ද, උදාහරණයක් වශයෙන්, අතුරුදහන් වූවන්

පිළිබඳ කාර්යාලය පිහිටුවූව ද රාජ්‍යය විසින් එහි සාර්ථක බව සහතික කිරීමට ලබා දී ඇති සහයෝගය ප්‍රමාණවත් නොවන බව ජනතාවගේ නිරීක්ෂණයයි. යුධ සමය තුළ කණ්ඩායම්වලට බෙදීමට සිදු වූ විවිධ ප්‍රජාවන්හට නැගෙනහිර පළාත තුළ එකිනෙකට ඉතා ආසන්නව ජීවත්වීමට සිදුවීම නිසා එම ප්‍රදේශයේ ආතතීන් තවමත් පූර්ණ වශයෙන් සංසිඳී නොමැත. එම ප්‍රදේශයන් හි දෙමළ හා මුස්ලිම් ප්‍රජාව අතර කාලාන්තරයක් තිස්සේ පැවතුණු එදිරිවාදිකම් පාස්කු ප්‍රහාරයත් සමඟ යළි උග්‍ර වී ඇති බව පෙනේ. ස්මාරකයක් ඉදි කිරීම සඳහා සිදු කරන මුල් පිරීම පැරණි එදිරිවාදිකම් නැවත ඉස්මතු වීමට හේතුවිය හැකි බවට ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ජනතාව පළ කළ අදහස් අනුව එම ප්‍රදේශයේ දෙමළ හා සිංහල ජනතාව අතර සාමය පවත්වාගෙන යන්නේ අසීරුතා මධ්‍යයේ බව අපට අනාවරණය විය. එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් 1990දී පළවා හරින ලද, වර්තමානයේ නැවත සිය ප්‍රදේශවලට ආපසු පැමිණ ඇති උතුරේ මුස්ලිම් ප්‍රජාව, ඔවුන්ගේ අවතැන්වීම පිළිබඳ වෘත්තාන්තය නිහඬ වී ඇති බව සඳහන් කරමින් අනුස්මරණය කිරීමේ ක්‍රමවේදයක් ලෙස ඉතිහාසය ලේඛනගත කිරීම සුදුසු බව යෝජනා කරන ලදි.

**පීඩාවට පත් වූ බොහෝ පුද්ගලයන් කොළඹ නගරයේ ජාතික ස්මාරකයක් ඉදි කිරීම පිළිබඳ උනන්දුවක් නොදැක්වූ අතර එම අදහස පවා බැහැර කරනු ලැබීය. නමුත්, රාජ්‍ය අනුග්‍රහය සහිතව ප්‍රාදේශීය මට්ටමින් අනුස්මරණය කිරීම් සහ ප්‍රජා මට්ටමේ ප්‍රතිසන්ධාන මුලපිරීම් සඳහා ඇති හැකියාව පිළිබඳව උනන්දුවක් පළ කළහ.** විවිධ ප්‍රදේශ පුරා විහිදී සිටින පීඩාවට පත් ප්‍රජාව, කොළඹ නගරයේ ස්මාරකයක් ඉදි කිරීම පිළිබඳ අදහස පැහැදිලිවම ප්‍රතික්ෂේප කළහ. ස්මාරකය ඉදි කරනු ලබන ස්ථානය වෙත ප්‍රවේශ වීමට ඇති දුෂ්කරතා සහ එකී ස්ථානය නුපුරුදු වීම හේතුවෙන් කොළඹ නගරයේ ඉදි කරනු ලබන ස්මාරකයක් තුළින් ඔවුන් කිසිසේත් නියෝජනය නොවනු ඇතැයි යන්න ඔවුන්ගේ හැඟීම විය. ස්මාරකයක් කොළඹ නගරයේ ඉදි කරන්නේ නම් එය පීඩාවට පත්වූ ජනතාවගේ ජීවන අත්දැකීම්වලින් දුරස්වන අතර පිටස්තර පුද්ගලයන්ට පමණක් අර්ථාන්විත වන සංකේතයක් වේ. "එය ජනතාවට ඡායාරූප ගැනීම සඳහා පවතින සංචාරක ආකර්ෂණයට ලක්වන තවත් එක් ස්ථානයක් වේවි" යන්න ජනතාවගේ ප්‍රකාශය විය. ඔවුන් අපට තවදුරටත් පැවසුවේ, "ඔබට එය සිදු කළ හැකියි. නමුත් අපව එයට සම්බන්ධ කර ගන්න එපා" යන්නයි. රාජ්‍ය මඟින් කොළඹ දිස්ත්‍රික්කයෙහි ස්මාරකයක් ඉදි කිරීම මඟින් පීඩාවට පත් ප්‍රදේශයන්හී තවදුරටත් ස්මාරක අවශ්‍ය නොවන බවට අදහසක් ගම්‍ය වෙතැයි යන්න සමහර පුද්ගලයන්ගේ අවබෝධය විය.

**පීඩාවට පත් ජනතාවට ආසන්න ප්‍රදේශවල ස්මාරක ඉදි කිරීම සම්බන්ධයෙන් විකල්ප යෝජනා ඉදිරිපත් වුණි.** දිස්ත්‍රික්ක මට්ටමින් ස්මාරකයක් ඉදි කිරීම ප්‍රමාණවත් යැයි සමහර ප්‍රදේශවල ජනතාව සලකන ලදී. යුධ සමයේ සිදු වූ ප්‍රබල සිදුවීම් ස්මරණය සඳහා මේ වන විටත් අරන්තලාව ස්මාරකය සහ ගෝනගල ස්මාරකය නිර්මාණය වී ඇත. එවැනි තවත් සිදුවීම් ආවර්ජනය කරවන ස්මාරක ඉදිකිරීම සම්බන්ධව ද යෝජනා ඉදිරිපත් විය. විනාශයට පත්වූ ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීමෙන් කාත්තන්කුඩිය ප්‍රදේශයේ සිදු වූ සමූල ඝාතනය අනුස්මරණය කර ඇති ආකාරය ද සිහිපත් කරනු ලැබිණි. යාපනය අර්ධද්වීපය තුළ සිදුවූ සිද්ධීන් ස්මරණය වන පරිදි එවැනි කිසිදු සංරක්ෂණයක් සිදු වී නොමැත. ඒ නිසා එම මතකයන් සාක්ෂියක් නොමැතිව මැකී යන බවට අදහස් පළ විය. දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට සැලකිය යුතු දුරකින් පවතින ප්‍රදේශවල ජනතාව අනුස්මරණ ස්මාරක ප්‍රජාවට වඩාත්ම ආසන්න ප්‍රදේශවල ගොඩනැගිය යුතු බව යෝජනා කරන ලදී. තවත් පිරිසකට අවශ්‍ය වූයේ, තමන්ට දෛනික ජීවිතයේ කොටසක් වශයෙන් අනුස්මරණ කටයුතුවලට නියැළීම සඳහා ඔවුන්ගේ නිවෙස්වලට ආසන්නයෙන් ස්මාරක ඉදි කිරීමය.

**කෙසේවුවද, අනුස්මරණය තුළින් ගම්‍යමාන වන සිය ආදරණීයයන්ගේ ඉරණමේ සමාප්තිය භාරගැනීමට අතුරුදහන් වූවන්ගේ පවුල්වල පිරිස සූදානමක් නැති බව පෙනුණි.** ඔවුන් බලාපොරොත්තු වන්නේ අතුරුදහන් වූවන් පිළිබඳ සම්පූර්ණ තොරතුරු වේ. මඩකලපුවේ පැවති තොරතුරු විමසීමේදී, අතුරුදහන් වූවන්ගේ පවුල්වල නියෝජිතයන් ස්මාරක ඉදිකිරීම සඳහා රාජ්‍ය

විසින් සිදු කරනු ලබන මුලපිරීම සඳහා ඔවුන්ගේ සහය නොලැබෙන බව ප්‍රකාශ කරන ලදී. රාජ්‍ය විසින් අතුරුදහන් වූ සිය ආදරණීයයන් පිළිබඳ තොරතුරු සැපයීම ඔවුන්ගේ අවශ්‍යතාවය විය. 2009දී හමුදාව වෙත භාර දෙන ලද එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් සම්බන්ධ ගැටලු උතුරේත් නැගෙනහිරත් මහජන සැසිවල දී මතු විය. රාජ්‍ය විසින් සාමූහික අනුස්මරණ සිදු කිරීමට ප්‍රථමයෙන් මෙවැනි සිදුවීම් සම්බන්ධව වගවිය යුතු බව ඔවුන් අපට පැවසීය.

**දැනට අදහස් කරගෙන ඇති පරිදි සැලසුම් කරන ජාතික ස්මාරකයක් මගින් යුද්ධයෙන් අවතැන් වූ විශාල පිරිසක් වන ආබාධිත පුද්ගලයින් ආමන්ත්‍රණය නොකෙරේ.** යුද්ධය නිසා අබාධිත තත්ත්වයට පත්ව ජීවත් වන පිරිස ස්මාරකයක් තුළින් නියෝජනය වන්නේ සහ ඔවුන් පිළිබඳ ප්‍රකාශ වන්නේ කෙසේද? යුද්ධය හේතුවෙන් බොහෝ පිරිසක් අබාධිත වී ඇති අතර මියගිය පුද්ගලයින් අනුස්මරණය සඳහා වන ස්මාරකයක් හා ඔවුන්ගේ අත්දැකීම් අතර කිසිදු අදාළත්වයක් නොතිබිය හැකිය. යුද්ධය නිසා ඔවුන් ලද අත්දැකීම් සහ ජීවිතවල සිදු වූ පරිවර්තනය ස්මාරකයක් තුළින් ආමන්ත්‍රණය කෙරෙනුයේ කෙසේද? ආබාධිත ප්‍රජාව නියෝජනය කරන ලද පුද්ගලයින් විසින් මෙම ප්‍රශ්න යොමු කරනු ලැබීය.

**හමුදා සාමාජිකයන්ගේ පවුල් "ස්මාරක නිසා ඇතිවන විඩාව" හේතුවෙන් පීඩාවට පත්ව සිටී. දශක ගණනාවක රාජ්‍ය පැසසුම්වලින් ඉක්බිතිව මේ වන විට තමන්ව නොසලකා හැර තිබීම සම්බන්ධව අමනාපයෙන් පසුවන "රණවිරු" ප්‍රජාව සහ ඔවුන්ගේ පවුල් මෙම ව්‍යාපෘතිය පිළිබඳ විශ්වාසයක් නොදක්වයි.** හමුදා සාමාජිකයන්ගේ වියෝවීම් අනුස්මරණය සඳහා යොමු කරවන ස්මාරක බොහෝමයක් ඇති බව ඔවුන්ගේ අදහස විය. මේ අතරින් සමහර ස්මාරක දැඩි නොසලකා හැරීමට ලක් වී ඇත. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් එම ප්‍රජාව සැක පළ කර අතර එමගින් ළඟා කර ගත හැක්කේ කුමක්ද යන්න අවිනිශ්චිත බව ප්‍රකාශ කරමින් දේශපාලන අරමුණු සඳහා කමිටුව හසුරුවන බව හැඟවීය. වැඩිදුරටත් කමිටුව සමඟ කතා කිරීමෙන් අනතුරුව ඔවුන් මෙම ව්‍යාපෘතිය කෙරෙහි සිය එකඟතාවය ලබාදුන් නමුත් එවැනි ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් කිසිදු පුද්ගලික සම්බන්ධතාවයක් දැක්වීමට අකමැති බව ප්‍රකාශ කරන ලදි.

**ඉහත නිරීක්ෂණ අනුව, යුධ ගැටුම්වලින් පීඩාවටපත් ප්‍රජාව අතර පවතින ඉතිහාසගත එදිරිවාදීකම්, පවත්නා අසමගිතාවයන් හා නොසන්සුන්තාවන් සංසිඳවීම සඳහා ද, යුද්ධය හා එහි ප්‍රතිවිපාක හේතුවෙන් ජනතාව මුහුණ දෙන දුෂ්කරතා ආමන්ත්‍රණය කිරීම සඳහා ද ගතයුතු මූලික ක්‍රියාමාර්ග රැසක් ඉතිරිව පවතින බව කමිටුවේ නිගමනය විය. ජනාධිපති කාර්යාලය විසින් යොමුකරන ලද සටහනේ සඳහන් කර ඇති ආකාරයේ ස්මාරකයක් ඉදිකිරීම කළ යුතු වන්නේ, ජනතාවගේ වර්තමාන කටයුතු සම්බන්ධයෙන් ඉදිරි වසර 05ක කාලය තුළ ආමන්ත්‍රණය කිරීමෙන් පසුවයි.** එබැවින්, ජාතික සංහිඳියාව වෙනුවෙන් ස්මාරකයක් පිහිටුවීමට හැකිවනු පිණිස අතීතය පිළිබඳ සහසංවේදී අවබෝධයක් ඇති කරවීම වෙනුවෙන් ගතයුතු පියවර වශයෙන් පහත කරුණු කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ.

1. **වසර 26ක් පුරා ශ්‍රී ලංකාවේ පැවති යුද්ධය හා ගැටුම්වලට අදාළ සහ ඊට සම්බන්ධ කලාත්මක හා සංස්කෘතික ප්‍රකාශනයන් හි සුරක්ෂිතාගාරයක් ලෙස සංකේතාත්මක ගොඩනැගිල්ලක් ඉදිකිරීම කමිටුව නිර්දේශ කරනු ලබයි.** ගැටුම් සමය තුළ ගැටුමට අදාළ වූ සියලුම පාර්ශව විසින් සිදුකරන ලද කලාත්මක සහ ප්‍රචාරාත්මක ප්‍රකාශන එම වකවානුවේ දී පැවති සංවේදාතා පිළිබඳ අවබෝධය පුළුල් වන පරිදි එක්රැස් කර යුතු බව කමිටුවේ මතය වේ. දකුණේ ජාතිකවාදී කණ්ඩායම්, සාමය ගොඩනැගීම සඳහා කටයුතු කළ පිරිස්, එල්.ටී.ටී.ඊ. සහ එල්.ටී.ටී.ඊ හිතවාදීන් මෙන්ම උතුරේ එල්.ටී.ටී.ඊ සංවිධානයට එරෙහිවූවන්ගේ ප්‍රකාශන මේ සඳහා ඇතුළත් විය යුතුය. එවැනි ලියකියවිලි සහ නිර්මාණ එකතු කිරීම සහ ඉදිරිපත් කිරීම රාජ්‍ය සහාය ඇතිව, එම කර්තව්‍යය ඉටු කිරීම සඳහා ධාරිතාව සහිත විවිධ සංවිධාන විසින් රට පුරා විවිධ ස්ථානයන්හි ක්‍රියාත්මක කළ යුතුය.

2. ගැටුමේ සමස්ථ කාලය තුළ, විවිධ කණ්ඩායම් සහ පුද්ගලයන් අනුස්මරණය සහ ප්‍රතිසන්ධානය පිළිබඳ විවිධාකාරයෙන් සම්බන්ධ වෙමින් කටයුතු කර ඇත. ඒ අනුව බිහි වූ ප්‍රශස්ත කලාත්මක හා සංස්කෘතික ප්‍රකාශනාවලියක් පවතී. මෙම කමිටුවේ සාමාජිකයින්ගේ නිර්මාණ සහ ප්‍රකාශනද ඇතුළත් එම නිර්මාණ කේන්ද්‍රීය ස්ථානයක පිහිටුවන ලද සංකේතීය ගොඩනැගිල්ලක මහජන ප්‍රදර්ශනය සඳහා තැබිය යුතු ය. **රටේ පැවති දුෂ්කර අතීතය යම් ආකාරයකින් වාර්තා කිරීමට, ඒ පිළිබඳ අදහස් දැක්වීමට හෝ වෙනත් ආකාරයකින් එම අතීතය සමඟ ගනුදෙනු කිරීමට උත්සාහ දරන සංස්කෘතික නිර්මාණ සඳහා සුරක්ෂිතාගාරයක් පැවතිය යුතුය.**

3. **යුද්ධය අවසන් වී පළමු දස අවුරුද්ද තුළ ගන්නා ලද ප්‍රතිසන්ධාන මුලපිරීම් රාශියක් ඇති අතර, ඒවා ගොනුකර රාජ්‍ය විසින් තෝරා ගන්නා ලද ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතුය.**

4. රාජ්‍යයේ අවම මැදිහත්වීමකින් යුතුව ධෛර්යමත් කළ යුතු සහ සහාය දැක්විය යුතු ප්‍රතිසන්ධාන, සංහිඳියා සහ අනුස්මරණ කටයුතු ප්‍රජා මට්ටමින් උතුරු සහ නැගෙනහිර පළාත්වල දැනට ක්‍රියාත්මක වේ. අපගේ සොයා ගැනීම්වලින් ගම්‍ය වන්නේ, ජනතාව දෛනිකව අනුස්මරණය කිරීමේ කටයුතුවල නියැලෙන බවත්, ජනවාර්ගික සංහිඳියාව සඳහා ජන කණ්ඩායම් ක්‍රියා කරන බවත්ය. පීඩාවට පත් පුද්ගලයන්ගේ හිමිකාරිත්වය සහ සහයෝගය ලබා ගැනීම සඳහා මෙන්ම ජනවාර්ගික සංහිඳියාව ළඟා කර ගැනීම සඳහා වන ඕනෑම අනුස්මරණීය සංකේතයක් ජනතාවගේ එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා පිළිබඳව අවධානයට ගත යුතුය. **ජනතාවට සහාය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කළ හැකි ප්‍රජා අනුස්මරණ අරමුදලක් රාජ්‍ය විසින් සංවර්ධනය කළ යුතුය.** නිර්ණායක මාලාවක් සකස් කිරීමටත්, වසර 5ක කාලයක් සඳහා එවැනි අරමුදලක් කළමනාකරණය කිරීමටත් කමිටුවක් පිහිටුවිය යුතුය. අරමුදල, ප්‍රජාව වෙත දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රවේශ වීම සඳහා විමධ්‍යගත කළ යුතුය.

5. **ප්‍රතිසන්ධානය සහ අනුස්මරණය කිරීම සඳහා මිනිසුන්ට ඇති අයිතිය සම්බන්ධයෙන් රාජ්‍යයේ ස්ථාවරය ජනාධිපතිවරයා විසින් මහජනතාවට දැනුම් දෙන ලෙස අපි නිර්දේශ කරන්නෙමු.** උතුරේ සහ නැගෙනහිර ක්‍රියාත්මක හමුදාව කිසිදු අනුස්මරණ ක්‍රියාවකට අවසර ලබා නොදෙන තත්වයක් පවතියි. අනුස්මරණ කටයුතු සිදු කිරීම සඳහා සිවිල් වැසියන් දරන උත්සාහයන් කඩාකප්පල් නොකරන ලෙස හමුදාවට උපදෙස් දීම අත්‍යවශ්‍ය වේ. උතුරේ සහ නැගෙනහිර ජනතාව ද මෙරට ජීවත් වන සමාන පුරවැසියන් ලෙස ජීවිතය අත්විඳින බව සහතික කිරීමට රාජ්‍ය විසින් පියවර ගැනීම අපි නිර්දේශ කරන්නෙමු.

6. **ඉහත කරුණු ක්‍රියාත්මක කරනු ලබන වසර පහක කාලයකට පසු රටේ සියලුම ජනතාවට හිමිකම් ප්‍රකාශ කළ හැකි ජනවාර්ගික සංහිඳියාව සහ ප්‍රතිසන්ධානය සඳහා වූ එක් ජාතික ස්මාරකයක් පිළිබඳ අදහස නැවත සලකා බැලිය හැකිය.**

**සටහන:** ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජගත් වීරසිංහ, මහාචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර, මහාචාර්ය ටී. සනාතනන් සහ මහාචාර්ය ෆර්සානා එෆ්. හනීෆා විසින් ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සහ වාර්තාව සැකසීම සිදු කරන ලදී.

| | | |
|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජගත් වීරසිංහ (සභාපති)** | **මහාචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර (සාමාජික)** | **මහාචාර්ය ටී. සනාතනන් (සාමාජික)** |
| **මහාචාර්ය ෆර්සානා එෆ්. හනීෆා (සාමාජික)** | **තුෂාරි සූරියආරච්චි (සාමාජික)** | **මහින්ද විතානාරච්චි (සාමාජික)** |